# බාලසිංහම්ගේ සන්ධීය බොරුව

මේ රටේ ඇතැම් ඇංකරයෝ තම ප්‍රබුද්ධත්වය වචනවලට මුවා වී පෙන්වති. සකලකලා වල්ලභයකු ලෙස ප්‍රබුද්ධයන්ගෙන් බුහුමන් ලබන එක් හිටපු මහාචාර්යවරයෙක් එකල ඉන්දු ලංකා ගිවිසුම සම්බන්ධයෙන් එහි සඳහන් ඓතිහාසික වාසභූමි යන පද අල්ලාගෙන ඉන් කියැවෙන්නේ නිජභූමි නොවේ යැයි තර්ක කළේය. ඉන්දු ලංකා ගිවිසුමෙහි සඳහන් වන වචන කුමක් වුව ද ඉන් කියැවෙන්නේ ඊනියා සාම්ප්‍රදායික නිජභූමියක් යැයි අපි කීවෙමු. කෙතරම් මාක්ස්වාදය හා අපෝහකය ගැන කතා කළ ද මොවුන්ට ගතික හෙවත් වෙනස්වන ප්‍රවාහයක් තේරුම් ගැනීමට හැකියාවක් නැත. මේ මාක්ස්වාදින්ගෙන් කී දෙනකු හෙගල්ගේ න්‍යාය (ලොජික්) කියවා ඇත්දැයි නොදනිමි. බොහෝ දෙනා හෙගල් ගැන දන්නේ හෙගල් ගැන වෙන අය ලියා ඇති දේ කියැවීමෙනි. දෙමළ ජාතිවාදීන්ගේ නිජ භූමිය යන සංකල්පය වෙනුවට එදා ඉන්දියාව යොදා ගත් වචන ඓතිහාසික වාසභූමිය විය. ඒ හුදෙක් අතරමැදි වචන විය. ගතිකය තුළ ඓතිහාසික වාසභූමිය ඉතිහාසයට එක් වී ඇත. අද ඒ වචන යොදා ගන්නෙක් නැත.

අද වෙනත් වචන යොදා ගැනෙයි. නොබෝදා ලංකාවේ නව අගනුවර වූ ඔස්ලෝහිදී ජී. එල්. පීරිස් හා ඇන්ටන් බාලසිංහම් ලංකාවට ෆෙඩරල් රාජ්‍ය ක්‍රමයක් හඳුන්වාදීම ගැන කතා කර ඇත. මෙය කොටි ත්‍රස්තවාදීන්ගේ ස්ථාවරය වෙනස් වීමක් ලෙස ඇතැම්හු විග්‍රහ කරති. අපි මෙහිදී බාලසිංහම් කියන දෑ ගැන නොව ඉන් අදහස් වන්නේ කුමක්ද යන්න ගැන විමසිලිමත් වෙමු. එමෙන් ම මේ සෑම ප්‍රකාශයක් ම යම් සන්දර්භයක ලා විශ්ලේෂණය කරමු. ඒ විශ්ලේෂණය කෙරෙන්නේ යම් මූලික ප්‍රවාදයක් තුළ මිස ඒ ඒ ප්‍රකාශ වෙන වෙන ම ස්ථිතික ව ගනිමින් නොවේ. මෙරට දෙමළ ජාතිවාදය බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයේ නිර්මිතයක් බවත් එය යොදා ගැනෙන්නේ සිංහලත්වයට ද හිමි තැන අහිමි කිරීමට බවත් අපි කියා සිටිමු. සිංහලත්වයට එරෙහිව දෙමල ජාතිවාදය නිර්මාණය කර බෞතීස්ම කර හදා වඩාගත් බටහිරයෝ එයට අවශ්‍ය පිළිගැනීම ද ලබාදුන්හ. පසුගිය අවුරුදු හතළිහක පමණ කාලයක් තුළ දෙමළ ජාතිවාදයට ලොව පුරා සිංහලයන්ට විරුද්ධව විශාල ප්‍රචාරයක් ගෙන ගිය හැකි වූයේ දෙමළ ජාතිවාදීන්ගේ දක්ෂ කමකට නොවේ. ඒ බටහිරයන්ගේ, විශේෂයෙන්ම බටහිර ජනමාධ්‍යවල සහාය දෙමළ ජාතිවාදීන්ට ලැබුණු බැවිනි. මේ රටේ දෙමළ ජනයාට සිංහලයන්ගෙන් වී ඇති අසාධාරණයක් නොමැති විටකදී සිංහලයන් විශේෂයෙන්ම සිංහල බෞද්ධයන් යම පල්ලන් මෙන් ක්‍රියාකර ඇතැයි බටහිර උගත්තු කීහ. මෙරට ඊනියා රාජ්‍ය නොවන සංවිධානවල හා විශ්ව විද්‍යාලවල කසිකබල් ඇංකර උගත්තු ඒ මත මෙරට ප්‍රතිරාවය කිරීමට ඉදිරිපත් වූහ.

අවුරුදු හාරසිය පණහක බටහිර ක්‍රිස්තියානි යටත් විජිතවාදයකින් පසුව සිංහල බෞද්ධයන්ට නැති කළ අයිතිවාසිකම් (බටහිරයන්ගේ චින්තනයෙහි ඇත්තේ ඉල්ලීම් හා අයිතිවාසිකම්ය.) කන්දරාවකින් අංශු මාත්‍රයක් හෝ සිංහල බෞද්ධයනට ආපසු ලබාගැනීමට හැකි විණි නම් ඒ 1956 - 1962 තරම් සුළු කාලයක් තුළ පමණය. මේ අංශු මාත්‍රය දිනා ගැනීම බටහිරයන්ගේ ආධාර ඇතිව දෙමළ ජාතිවාදීන් ප්‍රචාරය කළේ දෙමළ ජනතාවට කරන ලද අසාධාරණයක් ලෙසය. 1977 සිට කෙරුණේ මේ සුළු කාලය තුළ දිනාගත් ඒ අංශුමාත්‍ර අයිතීන් පවා ක්‍රමයෙන් නැති කර තව තවත් දේ සිංහලයන්ට අහිමි කිරීමය. අද සිංහලයන්ට උතුරු හා නැගෙනහිර පළාත් ද අහිමි කෙරෙමින් ඇත. එපමණක් නොව මුළු රටම බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යයට තව තවත් යට කෙරෙමින් පවතියි. මෙරට ඕල්කට් බෞද්ධයනට පමණක් නොව සිංහල බෞද්ධයනට ද අද ජීවත් වීමට සිදු වී ඇත්තේ බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියක් තුළය.

අද කොළඹ නගරය රාත්‍රි කාලයට විදුලි බුබුළු දැල්වීමෙන් නත්තල් උත්සව සමය සඳහා අලංකාර කෙරෙයි. ඉංගිරිසි ක්‍රිස්තියානි ආණ්ඩුකාරවරුන්ගේ කාලයට නැවත යෑමට ඇතැමුන්ට අවශ්‍ය වී ඇති බව පැහැදිලිය. පසුගිය වෙසක් සමයෙහි තොරණ දවස් තුනක් එළිය කිරීමට කරු ජයසූරිය මහතාගෙන් විශේෂ අවසරයක් ගැනීමට සිදුවිය. එහි දී ජල විදුලිය පිළිබඳ ප්‍රශ්නය ඇතැම්හු ගෙන ආහ. ඕල්කට් බෞද්ධයන්ගේ ද සහාය ඇතුව තවත් පිරිසක් ආමිශ පූජාව පහත් කර දක්වමින් සිංහල බෞද්ධයන් ලවා සිල් රැක්කවීමට උත්සාහ කළහ. එහෙත් අද කිසිවෙක් ජල විදුලි ප්‍රශ්නයක් ගැන කතා නොකරති. මේ දිනවල වහින්නේ යැයි ඔවුන් කියනු ඇත. එසේත් නැත්නම් තොරණ සමග සංසන්දනය කළ විට වැය වන්නේ අඩු විදුලිය ප්‍රමාණයක් යැයි කියනු ඇත. එහෙත් අප වහින දිනවල විදුලිය නාස්ති

© Prof. Nalin De Silva

කර පායන කාලයෙහි පමණක් විදුලිය අර පිරිමැස්මෙන් යොදා ගත යුතු බව ඔවුන් කියන්නේද? අනෙක් අතට ක්‍රිස්තුස් වහන්සේ මේ සැරසිලි අනුමත කෙළේ දැයි දැන ගැනීමට අර ආමිෂ පූජා විරෝධීන්ට අවශ්‍ය නොවේ.

ක්‍රිස්තු භක්තියන් නත්තල සැමරීම පිළිබඳ ප්‍රශ්නයක් අපට නැත. එහෙත් මෙහි දී සිදු වන්නේ එවැනි අහිංසක ක්‍රියාවක් නොවේ. මේ සුළුවෙන් වුවත් බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යය සිංහල බෞද්ධයන් මත තව තවත් පැටවීමකි. ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යය එසේ තර කෙරෙන්නේ වැඩි වශයෙන්ම සිංහල බෞද්ධයන්ගේ මුදලින් වීම මෙහි ඇති සරදම වෙයි. සිංහල බෞද්ධයන් ජනගහනයෙන් 70% ට වැඩි බැවින් ආණ්ඩුව වැඩි බදු මුදලක් අය කර ගන්නේ ඔවුන්ගෙනි. අවුරුදු හාරසිය පණහක යටත් විජිත යුගයකින් පසු 1956 - 1962 කාලය තුළ සිංහල බෞද්ධයන් ලබාගත් අංශු මාත්‍ර නිදහස නැති කිරීම මේ යුගයේ බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යයෙහි අවශ්‍යතාවක් වී ඇත. ඇංකරයන්ට මේ කිසිවක් ගැන අවබෝධයක් නැත්තේ ඔවුන් තනිකරම බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයෙහි ගැත්තන් වී ඇති බැවිනි. ඔවුන් ඉගෙන ගන්නා දැනුමම බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියක නිර්මානය කෙරුණකි. බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික යටත් විජිතවාදය ඔවුන්ට උගන්වා ඇත්තේ මේ දැනුමේ සංස්කෘතික සාපේක්ෂී බව ඉවත ලා එය ඊනියා වාස්තවික දැනුමක් ලෙස ගැනීමටය.

මේ පසුබිම තුළ බාලසිංහම්ගේ ප්‍රකාශය ගැන සිත යොමු කරමු. ඒ ප්‍රකාශ වර්ග දෙකකි. එක් ප්‍රකාශ වර්ගයක් කෙරෙන්නේ දෙමළෙන් පමණකි. ඒ පොදුවේ දෙමළ ජනයාටත් විශේෂයෙන්ම කොටි ත්‍රස්තවාදීන්ටත් වෙයි. අනෙක් ප්‍රකාශ කෙරෙන්නේ ඉංගිරිසියෙනි. මේ ඉංගිරිසි ප්‍රකාශ සිංහලයන් වෙනුවෙන් මිස බටහිරයන් වෙනුවෙන් නොවේ. බටහිරයෝ දෙමළ ජාතිවාදය ආරක්ෂා කරති. එයට රුකුල් දෙති. ඔවුහු බාලසිංහම් මෙන්ම ප්‍රභාකරන් ද දෙමළෙන් කියන්නේ කුමක්දැයි දනිති. ඔවුන්ගේ චරපුරුෂ සේවාවන්ට එය දැනගැනීම ප්‍රශ්නයක් නොවේ. කොටි ත්‍රස්තවාදීන්ගේ දෙමළ ප්‍රකාශ ගැන අවබෝධයක් නැත්තේ සිංහලයන්ටය. සිංහලයන් මුළා කිරීම සඳහා කොටි නායකයෝ ඉංගිරිසියෙන් ඇතැම් දේ කියති. මේ දෑ දෙමළෙන් කියන දෑම නොවීම මෙහි ඇති ප්‍රශ්නය වෙයි. බාලසිංහම් ලන්ඩනයේ කොටි අනුගාමිකයන් අමතමින් ලංකාවේ දැන් රාජ්‍ය දෙකක් ඇති බව දෙමළෙන් කීවේය. එය මෙරට දෙමළ පුවත්පතක පළ විය. අයිලන්ඩ් පුවත්පත එය ඉංගිරිසියට පරිවර්තනය කර පළ කළ අවස්ථාවෙහි ආණ්ඩුව නමින් ඇති පරිපාලන රථාව කලබලයට පත් විය. ප්‍රභාකරන්ගේ උපන්දින කතාවෙහි කොටින්ගේ පිපාසය ස්වාධීන දෙමළ ජාතියක් යනුවෙන් දෙමළෙන් කී කොටස තම ඉංගිරිසි පුවත්පත් නිවේදනයෙහි පළ නොකිරීමට කොටි වග බලා ගත්හ. එහෙත් මේ අතර කොටි ත්‍රස්තවාදීහු ඊනියා ෆෙඩරල් ක්‍රමයක් ගැන ඉංගිරිසියෙන් කියති.

ඉන්දු ලංකා ගිවිසුමෙහි දෙමළ නිජභූමිය යන්න ඊනියා ඓතිහාසික වාස භූමි ලෙස හැඳින්වූ ආකාරයට දැන් ෆෙඩරල් යැයි කියන්නේ කොන්ෆෙඩරල් හෙවත් සහසන්ධීය රාජ්‍යයක් සඳහාය. දෙමළ ජාතිවාදී ප්‍රවාහය තුළ එය එසේ සිදු වෙයි. දෙමළ ජාතිවාදයට අවශ්‍ය ඊළමක් මිස ෆෙඩරල් ක්‍රමයක් නොවේ. (ෆෙඩරල් ක්‍රමය උචිත යැයි මෙයින් නොකියැවෙයි.) ක්‍රිස්තියානි සංස්කෘතියක වූ ඇතැම් ඇම්බැට්ට ලේඛකයන් දෙමළ ජාතිවාදීන් ඊළම ඉල්ලුවේ ෆෙඩරල් දිනාගැනීමට මිස ඊළාම් අවශ්‍ය නොවන නිසා බව කියන්නේ තම හාම්පුතා රැකගැනීමටය. ප්‍රභාකරන් මෙතරම් මිනීමැරුවේ, දෙමළ තරුණ තරුණියන් ද බිලි දුන්නේ, ෆෙඩරල් දිනාගැනීමට යැයි කියන්නේ නොම්මර එකේ බඩගෝස්තරවාදී සිංහල බෞද්ධ විරෝධියෙකි. චෙල්වනායගම්ගේ කාලයේ සිට දෙමළ ජාතිවාදය යොදාගන්නා උපක්‍රමයක් වෙයි. ඒ දැන් ටිකක් දිනාගෙන පසුව ගොඩක් දිනාගැනීමය. ලිට්ල් නව් මෝර් ලේටර් යනුවෙන් චෙල්වනායගම් තම ප්‍රතිපත්තිය පැහැදිලි කර ඇත. ෆෙඩරල් යන්නට ප්‍රභාකරන් අද කැමති විය යුත්තේ ඇයි? පොදු පෙරමුණ පැකේජය නමින් දුන්නේ ෆෙඩරල් ක්‍රමයකි. එදා ප්‍රභාකරන් එය නොපිළිගත්තේය. ජී. එල්. පීරිස් සමඟ එකතු වී සිංහලයන් තාවකාලිකව

රැවටීමට බාලසිංහම් ෆෙඩරල් පිළිගන්නා බව කීව ද අවසානයේදී සහසන්ධිය රාජ්‍යයක් පිහිටුවීම අලි කොටි ගිවිසුමේ එකඟත්වය බව පැහැදිලිය. රනිල් වික්‍රමසිංහ මහතා අවුරුදු දෙක තුනක කාලයක් තිස්සේ කියන අසමමිතික (අසමජ්ජාති) බලය බෙදීමෙන් අදහස් කරන්නේ සහසන්ධීය රාජ්‍යයක් පිහිටුවීම බව අපි ඒ දිනවලම ප්‍රකාශ කළෙමු.

කලින් කී සකල කලා වල්ලභ මහදුරා ළඟදී ලියූ ලිපියක දෙමළ ජාතිවාදීන් වෙනම රාජ්‍යයක් පිහිටුවා එය අනෙක් රටවල් ලවා පිළිගන්වනු ලැබීමට ඉඩක් නැතැයි කියා තිබුණේය. සහසන්ධීය රාජ්‍යයක් පිහිටුවීමෙන් පසුව කළ යුතුව

© Prof. Nalin De Silva

ඇත්තේ ප්‍රභාකරන් හෝ වෙනත් කොටි ත්‍රස්තවාදි නායකයකු වෙනම රාජ්‍යයක් ප්‍රකාශ කිරීම පමණකි. නාමිකව පමණක් තනි රාජ්‍යයක් වූ සහසන්ධීය රාජ්‍යයක් එසේ වෙන් කිරීම ඉතා පහසු දෙයකි. එවැනි රාජ්‍යයක් පිළිගැනීමට බටහිර ක්‍රිස්තියානි රාජ්‍ය පුල පුලා බලා සිටියි. එමගින් සිංහලත්වයට උතුරු හා නැගෙනහිර පළාත් අහිමි කෙරෙන අතර එය ඉන්දියාවේ භෞමික අඛණ්ඩතාවයට තර්ජනයක් ද වන බව ඔවුහු දනිති.

අද කොටි ත්‍රස්තවාදීහු, ආණ්ඩුව හා හමුදාව සමග සම තත්වයෙහි ලා සැලකෙති. පසුගිය දා ස්විට්සර්ලන්තයට ගිය කොටි එරට රාජ්‍ය නායකයන් විසින් හඳුන්වා දෙනු ලැබ ඇත්තේ නිල මට්ටමකිනි. කරුණා නම් මිනීමරුවා හඳුන්වා දී ඇත්තේ ලංකාවේ නැගෙනහිර පළාතේ හමුදා අණ දෙන නිලධාරියා ලෙසය. බටහිරයන් කරන්නේ බොරුවක් බවත් මේ සිදුවන්නේ දෙමළ ජාතිවාදය දඩමීමාකර ගනිමින් බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යය පැතිරවීම බවත් තවමත් ඇතැම් සිංහලයෝ නොපිළිගනිති. එහෙත් බටහිරයන් මෙසේ හැසිරෙන්නේ ඇයි ද යන්න ඔවුහු විකල්ප පිළිතුරක් ද නොදෙති. බටහිරයන් කොටින්ට සලකන්නේ අල් ක්වේඩා, අයි. ආර්. ඒ. සංවිධානවලට සලකන ආකාරයෙන් නොවේ. මීළඟ පියවර ලෙස කොටි අවි අත්හැරිය යුතු යැයි ආර්මිටේජ් ඔස්ලෝ නාඩගමේදී කී විට බාලසිංහම් එයට දැඩි පිළිතුරක් දෙමින් කීවේ තම අභිලාෂ මුදුන්පත් කර ගන්නා තුරු කොටි අවි අත්නොහරින බවය. ඉන් පසු ඇමරිකාව ඒ පිළිබඳ කිසිවක් නොකෙළේය. බටහිර ක්‍රිස්තියානි රටවල් බලා සිටින්නේ වෙනම රාජ්‍යය පිළිගැනීමටය. ඉන්දියාව නොවන්නට මේ වන විටත් ඒ ටික සිදුවී හමාරය. මේ ස්විට්සර්ලන්ත චාරිකාවට පස් ගව මහනුන් ද එකතු වී ඇති බව සැළය. ස්කොට්ලන්තයට හා වේල්සයට බලය බෙදා දී ඇති අන්දම ගැන ඊනියා අධ්‍යයනයක යෙදීම සඳහා එහි ගිය මොවුන් ස්විට්සර්ලන්තයට ද ගොස් ඇත. බලය බෙදාදීම නිර්දේශ කරමින් මොවුන් අවසානයේදී වාර්තාවක් පිළිගැන්වුවහොත් එය ලියනු ඇත්තේ කුමාර රූපසිංහ හෝ ඔහුගේ ගෝලයකු බව දැනටමත් බොහෝ දෙනාගේ පිළිගැනීමය.

ඊළම පිළිගැන්වීම සඳහා කොටි ඊනියා උසාවි නැගෙනහිර පළාතේ පිහිටුවා ඇත. ආණ්ඩුව ඒ සම්බන්ධයෙන් කීවේ මේ කොටි උසාවි බොහෝ කලක සිට ක්‍රියාත්මක වන බවය. එසේ වුවත් ආණ්ඩුව කළ යුතුව තිබුණේ ඒ වසා දැමීම මිස එහි ක්‍රියාකාරීත්වය සාධාරණය කිරීම නොවේ. කෙසේ වෙතත් පාවාදීමේ ගිවිසුම අත්සන් කළ පෙබරවාරියට පෙර නැගෙනහිර පළාතේ කිසිම තැනක කොටි උසාවි නොතිබුණි. ඒ තිබුණේ නම් වන්නියේ පමණය. පෙබරවාරියෙන් පසුව සිදුවන්නේ උතුරු හා නැගෙනහිර පළාත්වල මෙතෙක් හමුදාව ක්‍රියාකාරී වූ ප්‍රදේශවලට එකම වෙඩි උණ්ඩයක් හෝ වැය නොකර කොටි ඇතුල්වීම පමණය. කොටි උසාවි පිහිටුවීම පිළිබඳව පොලිස්පතිවරයා හා නීතිපතිවරයා නිහඬව සිටිති. මේ සියල්ල සිදු වෙද්දී ඇමැතිවරු කොටි ත්‍රස්තවාදීන් ශුද්ධ කරති. බාලසිංහම් අවි අත්හරින්නේ නැතැයි කී බව වාර්තා වූ විට පීරිස් කියාසිටියේ බාලසිංහම් එවැන්නක් නොකී බවය. පසුගියදා අගමැති ජපානයේදී කොටි හා අල් ක්වේඩා අතර සම්බන්ධයක් නැතැයි කීවේය. එසේ නිශ්චිතව කියන්නේ ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ කිරීමෙන් පසුවද? එසේ සම්බන්ධයක් නැති වුවත් කොටි ත්‍රස්තවාදීහු නොවෙත්ද? ලංකා ඉතිහාසයේ මහා පාවාදීම සිදුවෙද්දී පෞද්ගලිකව වෙන කෙනකුට දෙවැනි (සෙකන්ඩ්) වීමට නොහැකියාවෙන් සිංහලයෝ (පාසල් සිසුන් ද ඇතුළුව) උගුල් අදිමින් මිනී මරා ගනිමින් ජාතිය තුන්වැනි කරති. අද අවශ්‍ය වන්නේ පෞද්ගලිකව දෙවැනි වී හෝ ජාතිය පළමුවැනි කිරීමය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva